සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education NWP වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

71 S I

දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2020

**Second Term Test - Grade 13 - 2020**

විභාග අංකය ............................ සිංහල I කාලය පැය තුනයි

- **පළමුවන ප්‍රශ්නය ඇතුළු ව <u>ප්‍රශ්න පහකට</u> පිළිතුරු සපයන්න.**
- **පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදා ගන්න.**

01. පහත දී ඇති උධෘත අතුරෙන් හතරක් තෝරාගෙන ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. (මෙම ප්‍රශ්නයට පිළිතුරු ලිවීමේදී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදා ගන්න)

(අ) ගල් පාවුළට ගිය කලට ''සොඳුර, මෙතැන් පටන් තොප හා මා හා යත් මුත් සෙස්සන් ගෙයන්ට බැරි ය. බොහෝ දෙනා ගෙන ගිය කල කසළත් කෙරෙති. නවතාලියත් නොහැක්ක. දෙන්නා පමණෙක් යම්හ. දෙවියන්ට පුදන්ට ගෙන යන දෙය බැවින් පිදේනිය තොපි ම අල්වා ගනුව'යි කිවූ ය. උයිත් එලෙස ම කළහ. සොරාත් උන් කැඳවාගෙන සොරුන් හෙළන ගල උඩට නැංගේ ය. ඒ ගලටත් එක් දසාවෙකින් මිනිස්සු නැඟෙති. එක් දසාවක් ප්‍රපාත ව තිබෙන හෙයින් ගල් මුඳුනෙහි සිටලා එතැනින් සොරුන් හෙළති. ඌ කඩ කඩ ව බිම හෙති. එහෙයින් ඒ ගලට ''සොර පවුව'' යයි කියති. සිටු දුවණියෝ ද ගල මුදුන්නේ සිට 'බිලියම් කරන්නැ'යි කිවූ ය. ඒ බැණ නොගැඟෙන්නේ ය. 'බැණ නොනැඟෙන්නේ හැයි දැ'යි විචාළ හෙයින් 'මට බිළියමින් කම් නැත. බිලියම් පිට ලාලා තොප මෙතැනට ගෙනන පිණිසය'යි කී ය.

(i) ගල් පාමුලට ගිය පසු සොරා කුණ්ඩලකේසී අමතා ඔවුන් දෙදෙනා පමණක් යා යුතු බව කීවේ කවර අදහසකින් ද?

(ii) කුණ්ඩලකේසී සිය සැමියාට බෙහෙවින්ම පක්ෂග්‍රාහී බව ප්‍රකාශවන අවස්ථාවක් දක්වන්න.

(iii) **''මට බිළියමින් කම් නැත. බිලියම් පිට ලාලා f;dm මෙතැනට ගෙනන පිණිස'** ය. මෙම උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.

(iv) 'පිදේනිය' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 4)

(ආ) එබැවින් ස්ත්‍රීන්ගේ වසඟත්වයට පැමිණියා වූ කාමී පුරුෂයෝ පරලොව විඳිනා අපාය දුක් තබා මෙම ජාතියෙහි මෙසේ නොයෙක් වැසන විඳ මරණයටත් පැමිණෙන්නාහු ම ය. ස්ත්‍රීහු නම් පුරුෂයන් වඤ්චා කරන හෙයින් මායා රූපයක් වැනිය හ; ඇඳහිලි නොකොට හැකි හෙයින් මිරිඟු ජලයක් වැනිය හ; ශෝකය රෝගය උපද්‍රවය යන මොවුන් උපදවන ආකරයක් වැනිය හ; පුරුෂයන්ට තද වූ බන්ධනයක් වැනිය හ; කාමී පුරුෂයන් බඳනා පිණිස මරහු විසින් මවන ලද තද මල පතක් වැනිය හ; වැලසින්නන් වසන ගුහාවක් වැනිය හ; මරහු වසන ලෙනදොරක් වැනිය හ; එබඳු ස්ත්‍රීන් කෙරෙහි යම් කිසි පුරුෂයෙක් විශ්වාස කෙරේ නම් එතෙම මනුෂ්‍යයන් කෙරෙහි අධමයා නම් වේ.

(i) මෙහි දක්වන පරිදි ස්ත්‍රීන්ගේ ලක්ෂණ මොනවාද?

(ii) ස්ත්‍රීන්ගේ වසඟත්වයට පත්වීමෙන් කාමී පුරුෂයන්ට අත්වන ඉරණම කුමක්ද?

(iii) **''කාමී පුරුෂයන් බඳනා පිණිස uryq úiska මවන ලද තද මලක් වැනියහ''** මෙම උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.

(iv) 'මිරිඟු ජලයක්' යන යෙදුමට කෙටි විවරණ සපයන්න. (ලකුණු 4)

(ඉ) 'චුල්ල ධනුද්ධරයෝ පඤ්චායුධ සන්නද්ධ ව ඊ දඬු පන්සියයකුත් ඇගෙන යන්නාහු හස්තියා දිව ගෙන එන්නා ඊ දණ්ඩක් ඇද පියා ඇරගෙන විද්දාහු වාත කුම්බයෙන් විද පලවා ඇතා එතන ම එළා නික්මුණු කලට, අනික් වනාන්තරයක සොරුන් පන් සියයක් දඩ මස් මරා පුළුස්සා කන කලට චුල්ලධනුද්ධරයෝ එතනට පැමිණ තමන් බිරින්දට කියන්නාහු 'දඩමස් පුළුස්සා කන මිනිසුන් උන් කෙතට ගොස් දඩ මස් ඉල්වා ගෙන එව'යි කියා යවූහ.

(i) චුල්ල ධනුද්ධරයන් විසින් ඇතා මරණයට පත් කළ ආකාරය කෙසේද?

(ii) චුල්ල ධනුද්ධර තම බිරිඳගෙන් ඉල්ලා සිටින ඉල්ලීම කුමක් ද?

(iii) **'වාත කුම්භයෙන් විද පලවා ඇතා එතනම එළා නික්මුණු කලට'** යන උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.

(iv) 'පඤ්චායුධ' යන වචනයට කෙටි විවරණ සපයන්න.

(ඊ) එකල රජගහනුවර බිම්බිසාර රජ්ජුරුවෝ එපවත් අසා ''චක්‍රවර්තීන් උපදනා වූ අමිතභෝගී සිටුවරුන්ගෙන් හා අටළොස් කෙළක් කුලයෙන් ශෝභාමත් වූ මාගේ මෙබඳු වූ ශ්‍රී නගරයක් විශාලා මහනුවරට එක ගණිකාවක නිසා අඩු වනු නොයෙදෙයි. මගේ නුවර ද වේශ්‍යාවකගෙන් හෝභාමත් කරවමි''යි සිතා එනුවර මුළුල්ලෙහි රූපත් වූ ස්ත්‍රීන් පරික්ෂා කොට සාලවතී නම් කුමාරිකාවක උතුම් රූ ඇති සේ අසා ඇය රාජාඞගණයට ගෙන්වා මුලු නුවර වැස්සන් රැස් කොට මෙපවත් කියා ''අපි ම ඇති කරම්හ'' යි මන්ත්‍රණය කොට නුවර වැසියන්ගෙන් මසුරන් දෙලක්ෂයක් හා තමන්ගෙන් ලක්ෂයක් හා මෙසේ තුන්ලක්ෂයක් මසුරන් හා වේශ්‍යාවන්ට සුදුසු වූ රුවන් පලඳනා හා පරිවාර ජනයන් හා උයන් පොකුණු බත් ගම් ආදී වූ නොයෙක් සැපත් හා සත්බුමු මහාපායකුදු දී.

(i) රජගහනුවර ශ්‍රී නගරයක්ව ඇත්තේ කවර හේතුන් නිසාද?

(ii) රජගහනුවර, විශාලාමහනුවරට දෙවෙනි වන්නේ කුමක් නිසාද?

(iii) **''රුවන් පළඳනා හා පරිවාර ජනයන් හා උයන් පොකුණු බත්ගම් ආදී නොයෙක් iem;a හා සත්බුමු මහාපායකුදු''** මෙම උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.

(iv) 'චක්‍රවර්තීන්' යන්නට කෙටි විවරණයක් සපයන්න. (ලකුණු 4)

(උ) දුමන මුල් ඉදුරු
ලවන ලොබලිය පඳුරු
එවෙණ නද මියුරු
සවන නොකරන කෙනෙක් කවුරු

බලමින් ලකුණු ගත
දුදන ගුණ දැන ඔහු සිත
නොවසව තෙපි මවෙත
සිල්ප නොදෙමැ'යි කිවෙන් මහසත

(i) මිහිරි වූ වීණා නාදයෙන් සිදුවන්නේ කුමක්ද?

(ii) ඔහුට ශිල්ප නොදෙන බව පැවසූයේ ඇයි?

(iii) **'දුමන මුල් ඉදුරු - ලවන ලොබලිය m÷re'** මෙම උද්ධෘතය ළිහිල් බසින් ලියන්න.

(iv) 'මහසත' යන්නට කෙටි විවරණයක් සපයන්න.

(ඌ) පහත සඳහන් උද්ධෘත අතුරෙන් හතරක අවස්ථා සම්බන්ධය දක්වන්න.

1. සියලු ම පින්කමට ප්‍රධාන වූ සිත පහදවා පින් කරව.
2. තොප කීවේ කාරණාමය ඥානවන්තයන් සිතුව මනා සිතුවිල්ලෙක්ම ය.
3. 'එසේ වූ නුඹ වහන්සේගේ ශ්‍රී පාදය වදිමි'යි වැදහොත්තීය.
4. 'කුමක් පිණිස මුරගාමු දැ' යි.
5. 'අද බෝනස් දවසනේ. කවුරුත් ටිකක් සන්තොස වෙන දවස. මාත් එහෙමයි.'
6. 'මං ආපහු ගෙදර එන්ඩ ඕනෑ අප්පොච්චි. මට බෑ මේ ගෙදර ඉන්ඩ.'
7. 'කුමන උපායක් ද ඔබේ සිතෙහි ඇත්තේ'

(එ) පහත දැක්වෙන කාව්‍ය නිර්මාණයෙහි වස්තු විෂයෙහි සහ කාව්‍ය දර්ශනය කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් එම නිර්මාණය පිළිබඳ රසාස්වාදනයක් කරන්න.

පවුලේ බර අඩු කරන්ට ගෙදරින් පිටවන්නට පෙර
මතකද අම්මේ ඔබ මට ඇමතුවෙ පොඩි දුවේ කියල

ජීවිතයේ පළමු වරට තනිවුණු කල ඈත රටක
එහි මිනිසුන් හුග දෙනෙක්ම මට කීවේ ලිසී කියල

අතින් හිසින් බර උසුලන් පාර දිගේ මං යන කොට
දකින කෙනෙක් මට කිව්වේ ඒ වැඩකාරියක් කියල

පොඩි දරුවෙකු අතින් අරං පාසලකට මං යනකොට
එතන හිඳින අය කිව්වේ බේබිගෙ ආයම්ම කියල

කෑම බීම උයා පිහා මං දර දිය අදින කලට
දකින සියලු දෙනා කිව්වේ ගෙදර කුස්සි අම්ම කියල

එත් අම්මේ අදවස ගෙවිල නිදිපැදුරේ ඇළවුණාම
තවමත් හීනෙන් උඹ මට කියන්නේ පොඩිදුවේ කියල (ලකුණු 12)

02. ස්වකීය ශ්‍රාවකයාට ධර්මෝපදේශයත් කතා රසයත් උදාකර දීම සද්ධර්මරත්නාවලිය කතුවරයාගේ මූලික අරමුණකි. නියමිත කථා ඇසුරෙන් ගත් උදාහරණ සහිත ව පැහැදිලි කරන්න.

**නැතහොත්** (ල. 15)

ජාතක කතා රචනා කිරීමේ දී උපයුක්ත කර ගත් ආකෘතික ලක්ෂණ නිර්දේශිත ජාතක කතා ඇසුරෙන් උදාහරණ සපයමින් පහදා දෙන්න. (ල. 15)

03. යහපත් සාරධර්ම සංවර්ධනයෙහිලා ඉවහල් වන ආනිශංස ප්‍රකට කිරීමට සද්ධර්මාලංකාර කතුවරයා සමත් වී ඇත. නියමිත කතා වස්තු ඇසුරෙන් පහදන්න. (ල. 15)

**නැතහොත්**

(අ) සිංහල ගද්‍ය පද්‍ය සාහිත්‍ය ඉතිහාසය සම්බන්ධයෙන් දඹදෙණි යුගය කවරාකාර වැදගත්කමක් ගන්නේ දැයි සඳහන් කරන්න.

(ආ) ජීවක දක්ෂ ශිෂ්‍යයෙකු සේ ක්‍රියාකරන ආකාරය ජීවක කතා වස්තුවෙන් හෙළිවේ. නිදසුන් දෙමින් පැහැදිලි කරන්න.

04. විවිධ අවස්ථාවන්හි මිනිස් සිතුවිලි ක්‍රියාකරන ආකාරය තුළින් චරිත හඳුනාගත හැකි බව ගුත්තිල කාව්‍යය ඇසුරෙන් විමසන්න.

05. බැද්දේගම නවකතාවේ අවස්ථා හා සිද්ධි නිරූපණය තුළින් තත්කාලීන සමාජ ආර්ථික තොරතුරු රැසක් මැනවින් පිළිබිඹු වේ. නිදසුන් දෙමින් පැහැදිලි කරන්න.

06. කවියෙකුට අත්දැකීමක් කෙටිකතාව යථාර්ථවාදී රීතිය ඔස්සේ රචිත සාර්ථක කෙටිකතාවකි. විමසන්න.

07. නිසදැස් කවිය ශ්‍රව්‍ය ගෝචර ස්වරූපයට පමණක් සීමා නොවී දෘෂ්ටිගෝචර ස්වරූපයක් ප්‍රතියමාන කරයි. නිර්දිෂ්ට පද්‍ය පන්ති තුනක් ඇසුරින් සාකච්ඡා කරන්න.

08. 'පේමතෝ ජායතී සෝකෝ' නාට්‍යයේ විශේෂත්වය වනුයේ කාව්‍යමය භාෂා ව්‍යවහාරයක් යොදා ගැනීමයි. නිදසුන් දක්වමින් සාකච්ඡා කරන්න.

* * *

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

71 S II

දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2020

**Second Term Test - Grade 13 - 2020**

විභාග අංකය ............................ සිංහල II කාලය පැය තුනයි

- **I කොටසේ 1 ප්‍රශ්නය ද II කොටසේ 2 හා 3 ප්‍රශ්න ද, ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**
- **I ප්‍රශ්නයේ ඇති සියලු ම අනුකොටස්වලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.**
- **I කොටස II කොටසේ පිළිතුරුපත් සමඟ අමුණා භාර දෙන්න.**

## I කොටස

01. එක් එක් ප්‍රශ්නයට වඩාත් ගැළපෙන පිළිතුර තෝරා එයට හිමි අංකය වරහන තුළ ලියන්න.

1.1 ශ, ෂ, ස, හ යන අක්ෂර,

1. වර්ගාක්ෂර වේ. 2. ඌෂ්මාක්ෂර වේ. 3. මහාප්‍රාණ අක්ෂර වේ.
4. ඕෂ්ඨජ අක්ෂර වේ. 5. අන්තඃ ස්ථාක්ෂර වේ. (.........)

1.2 අක්ෂර වින්‍යාසය නිවැරදි වරණය වන්නේ,

1. ශෛල්‍යාගාරය, ඓෛතිහාසික, කෘතිම, විද්‍යාලීය, ස්වභාවික
2. ශල්‍යාගාරය, ඓතිහාසික, කෘත්‍රිම, විද්‍යාලයීය, ස්වාභාවික
3. ශෛල්‍යාගාරය, ඓතිහාසික, කෘත්‍රිම, විද්‍යාලීය, ස්වාභාවික
4. ශල්‍යාගාරය, ඓෛතිහාසික, කෘතිම, විද්‍යාලයීය, ස්වභාවික
5. ශෛල්‍යාගාරය, ඓතිහාසික, කෘත්‍රිම, විද්‍යාලීය, ස්වාභාවික (.........)

1.3 අකාරාදී පිළිවෙළ අනුව නිවැරදි වරණය වන්නේ,

1. ස්වීඩනය, භාරතය, ඕස්ට්‍රේලියාව, කොරියාව
2. සාගර, සිරිල්, සේනාරත්න, සෞම්‍ය
3. ගම්පොළ, දෙගල්දොරුව, මහනුවර, අනුරාධපුරය
4. මහින්ද, පෙරේරා, වීරසිංහ, ප්‍රේමතිලක
5. ස්වභාව, නිරතුරු, අනවරත, සතත (.........)

1.4 පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිරවද්‍ය ප්‍රකාශය තෝරන්න.

1. සංස්කෘත භාෂාවෙ ''ශ'' සහිත පද සිංහලට බිඳෙන විට ඒ සඳහා දන්තජ 'ස' යෙදේ.
2. ප්‍රාසාංගික හා ප්‍රාසංගික යන වචන දෙකෙන් ප්‍රාසාංගික යන්න නිවැරදිය.
3. තෙමේ, තොමෝ යනපද යෙදෙනවිට බහුවචන අර්ථය ගනී.
4. ල, ලු නිපාත විභක්ත්‍යාර්ථයේ යෙදේ.
5. ශ්‍රී පාද ආශ්‍රිත ජනවහරේ 'වන්දනා නඩේ' යනු පිරිසේ නායකයා හඳුන්වන පදයයි. (.........)

1.5 එකිනෙකට අනුරූප වන සේ වචන යුගල යෙදී ඇති වරණය තෝරන්න.

1. ධර්ම සභාව, අහස් ගඟ, වෙසතුරු දා, දීර්ඝ දේශනය
2. ත්‍රිපිටක දහම, අහස් ගඟ, බ්‍රහ්ම ලොව, අවධි විභක්ති
3. ප්‍රථම තෑග්ග, පංචශීලය, අග්‍රාමාත්‍ය, මාර්ග අනතුරු
4. ස්ත්‍රී සිත, මධ්‍ය මණ්ඩලය, මිශ්‍ර ක්‍රියා, මැති සභාව
5. අක්ෂර වින්‍යාසය, ඇඳුරු මඬුල්ල, සමුදුරු ගොස, ස්වභාවදහම. (.........)

1.6 තත්සම වචන පමණක් යෙදී ඇති වරණය තෝරන්න.

1. අභරණ, දෙරණ, උයන, ඉඳු
2. කර්තෘ, කාල, කෙස්, කොවුල්
3. ආචාර්ය, අඤ්ජන, අක්ෂි, අග්නි
4. චාරිත්‍ර, චර්ම, දිවි, දෙටු
5. දේශ, ද්‍රවිඩ, පත, පෙළ (.........)

1.7 තත්භව වචන පමණක් අන්තර්ගත වරණය තෝරන්න.

1. සතර, දසුන්, උපුල්, කුලුණු
2. ක්ෂේත්‍ර, ජම්බු, දඬු, තෑගි
3. නළ, නාභි, නිදසුන්, නිවන්
4. පරිච්ඡේද, පරුස, පුණ්‍ය, පින්
5. ප්‍රමාණ, පැතුම්, එල, බුදු (.........)

1.8 කර්ම, කර්තෘ, කරණ, සම්ප්‍රදාන යන විභක්තිවලට අයත් සමාස පද පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

1. පිංහාල්, ගල්පඩි, දෙව්දත්, ගත්කරු
2. ගත්කරු, දෙව්දත්, ගල්පඩි, පිංහාල්
3. දෙව්දත්, ගත්කරු, පිංහාල්, ගල්පඩි
4. ගල්පඩි, පිංහාල්, ගත්කරු, දෙව්දත්
5. ගත්කරු, ගල්පඩි, පිංහාල්, දෙව්දත් (.........)

1.9 කෘදන්ත පදයක් අන්තර්ගත **නොවන** වරණය තෝරන්න.

1. සිතු, ගෙතු, පැතු, එතු
2. සරන, දරණ, වරන, කරන
3. කරන්නේ, බලන්නේ, හඬන්නේ, ලියන්නේ.
4. කියමන්, බැලුමන්, හැඬුමන්, රුඟුමන්
5. හැඬීම්, නැටීම්, ගැයීම්, කැඩීම් (.........)

1.10 පහත සඳහන් උද්ධෘතවල තද කළු අකුරෙන් මුද්‍රිත පද අයත් ක්‍රියා වර්ගය පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

(අ) අව්වේ තිබෙන රස් මාලා අඩු **වේවා !**
(ආ) හිරු **නැගෙත්** මල් පිපෙයි.
(ඇ) මදක් **ඉවසව** කොල්ල.
(ඈ) ගුරුතුමිය සිසුන් **රැකීම පිණිස** නීති පැනවිය.

1. අසම්භාව්‍ය ක්‍රියා, ආශිර්වාද ක්‍රියා, අපර ක්‍රියා, විධි ක්‍රියා
2. ආශිර්වාද ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, විධි ක්‍රියා, අපර ක්‍රියා
3. විධි ක්‍රියා, අපර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, ආශිර්වාද ක්‍රියා
4. අපර ක්‍රියා, විධි ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, ආශිර්වාද ක්‍රියා
5. විධි ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, අපර ක්‍රියා, ආශිර්වාද ක්‍රියා (.........)

1.11 තද්ධිතයක් **නොවන** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.
1. ශීඝ්‍රගාමී, ගඟනගාමී, මන්දගාමී, සමගාමී
2. සිඟිති, කිනිති, කඩිති, මඩිති
3. පරීක්ෂණ, නිරීක්ෂණ, ගවේෂණ, පර්යේෂණ
4. දක්ෂතම, රජතම, රසතම, පාපතම
5. අරටු, දොරටු, වකුටු, ඇහැටු (.........)

1.12 උපසර්ගයක් යෙදී නොමැති පදයක් සහිත පද පේළිය තෝරන්න.
1. අප්‍රිය, අවිය, අමිතුරු, අමිශ්‍ර
2. දුර්මත, දුර්වර්ණ, දුර්ජන, දුර්වල
3. නිදුක්, නිරුදක, නිරන්තර, නිරවුල්
4. සංවර්ධන, සම්ප්‍රාප්තය, සම්බන්ධ, සංඛ්‍යාව
5. සුදන, සුපිරිසිදු, සුදම්, සුමිහිරි (.........)

1.13 නිපාතයක් නොවන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.
1. සේ, බඳු, විලස්, අයුරු
2. අතර, සිට, ඉක්බිති, ඉන්පසු
3. සාර, විතර, කා, අඩු.
4. ඇත, නමුත්, නොහොත්, හෝ
5. ද, සමඟ, කැටිව, ඕ, ලු (.........)

1.14 '**<u>ගුරුතුමා</u>** ලබා දුන් ගුරුහරුකම් **<u>දරුවන්ගේ</u>** අනාගත සාර්ථකත්වය **<u>පිණිස</u>** හේතුවිය.' යන වාක්‍යයෙහි වචන යෙදී ඇති පිළිවෙළ අනුව තද කළු අකුරින් මුද්‍රිත පද අයත් වන්නේ කුමන ව්‍යාකරණ අංග වලටද?
1. විභක්ති, නිපාත, සන්ධි
2. සන්ධි, නිපාත, විභක්ති
3. නිපාත, සන්ධි, විභක්ති
4. විභක්ති, සන්ධි, නිපාත
5. සන්ධි, විභක්ති, නිපාත (.........)

1.15 සමාන ව්‍යාකරණ ලක්ෂණ නිරූපණය කරන ක්‍රියා රූප සහිත වරණය තෝරන්න.
1. කැඩුවාය, ලැබුවාය. දුන්නීය, වැන්දාය.
2. රකෙයි, රකෙති, රකිණි, රකිති.
3. නටමින්, ගයගයා, බලතොත්, දුවමින්
4. දිව්වේය, බැලුවේය, ගියේය, ලිවුවාය.
5. වැස්සොත්. දිනුවොත්, කියකියා, ගියහොත් (.........)

1.16 සමාසයක් **<u>නොවන</u>** පදයක් ඇතුළත් වරණය තෝරන්න.
1. බත් බුලත්, ගොඩ මඩ, ඉර හඳ, ඇළ දොළ
2. කුකවි, කුපුරිස්, කුදිටු, කුපෝෂණ
3. මුතුදත්, කවිත්ව, සසඳවත, පද කමල
4. අත්කම්, වනමල්, මව්කිරි, මිහිදුම්
5. උළිඳු, සුන්තුරු, එරුණුහස්, බඹරුදුල (.........)

1.17 එකම වර්ගයට අයත් සන්ධි පද අන්තර්ගත වරණය තෝරන්න.
1. කාලෝචිත, ධනේශ්වර, පසිඳුරන්, වැටුසිපත
2. පන්නම්, කම්මල, දඩයම්, ඇස්සමු
3. සද්දන, රුප්පාව, අල්ල, තුනුවග
4. යනෙන, විදුරවි, ඇඳුරා, ගිරග
5. කුල්ලෙව්, සාතිශය, වැල්ලවුරු, සුවාසු (.........)

1.18 ව්‍යාකරණානුකූල ව **<u>නොගැළපෙන</u>** පදයක් සහිත වරණය තෝරන්න.

1. මහොර, බත්තුළු, සිපියෙව්, සද්දන
2. අරටු, කලටි, කැහැටු, ඉහටි
3. බුදුදහම, බෝධිපූජා, කිරිබත්, සඳරැස්
4. සුමිහිරි, සුරගුරු, සුපිපි, සුමුදු
5. පිණිස, කැටුව, විසින්, පවා (.........)

1.19 ව්‍යාකරණානුකූල ව නිවැරදි වැකිය තෝරන්න.

1. විනිසුරුතුමා වැරදි කරුවන්ට මරණ දඬුවම නියම කළහ.
2. අප විසින් දෙමව්පියෝ රැකිය යුත්තෙමු.
3. ඔවුහු බොරු කියතියි කවුරු විශ්වාස කරද්ද?
4. ගුරුවරු උදෙසා ගුරු උපහාර උලෙළක් ඔවුන් සංවිධානය කරති.
5. මිනිස්සු වැඩි දෙනෙක් රැස්වීමට සහභාගි වූහ. (.........)

1.20 ලේඛන ව්‍යවහාරයට වඩාත් සුදුසු වාක්‍යය සහිත වරණය තෝරන්න.

1. දැන් සේරම අය පන්තියට යන්න.
2. අපේ ගමට නියංආධාර දෙනවලු.
3. කොහෙද ඒ අයගේ ගෙදර?
4. අභිමානවත් පුරවැසියෙකු ලෙස තම යුතුකම් ඉටුකළ යුතුය.
5. අලුත් ආරංචි තියෙනවද? (.........)

## II කොටස

- **මෙම කොටසින් 2, 3 ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.**

02. (අ) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

පත්තිනියට වඩා හාත්පසින් ම වෙනස් චරිතලක්ෂණ ඇති කාන්තාවකි සොකරි. පති දම් රැකීම හෝ පති භක්තිය උසස් කොට නොසැලකූ සෙල්ලක්කාර තරුණියක ලෙස ගැමි නාටකයේ සොකරි නිරූපිතයි. උඩරට පළාත්වල ආඬි බලය අධික වූ කාලයක ඔවුන් නින්දාවට හා සමච්චලයට ලක්කිරීමේ යටි අදහසක් සොකරි නාටකය රචනා කළවුන් තුළ තිබෙන්නට ඇත. රටේ රාජ්‍ය බලයට පවා තර්ජනය කරමින් මන්දාරම්පුර වැනි පළාත්වල පාලන බලය අල්ලා ගන්නට තරම් එකල ''ආඬි'' නමින් ප්‍රසිද්ධ වූ, බ්‍රාහ්මණ පිරිසක් බලවත් වූහ. ආඬි ගුරුසමඟ පැමිණි සොකරි ද ඉන්දියානු වූවත් ඇගේ රූමත් බව නිසා සිංහලයින් ඇය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දැක්වූ අයුරු ද සොකරි නාටකයෙන් පැහැදිලි වේ. විදේශිකයන් සමඟ වුවද සාමකාමී සහජීවනයෙන් ජීවත් විය යුතු බවට පණිවිඩයක් ද ඉන් ලබාදෙන අතර, දේශීය රජුන්, වෙදුන්, ප්‍රභූන් හා රාජ්‍යනිලධාරීන් කෙරෙහි ජනතාව තුළ වූ අප්‍රසාදය මෙන්ම කෝපය ද මේ නාට්‍යයෙන් මැනවින් ප්‍රකාශ වෙයි. ඉන්දියාවෙන් මෙහි සංක්‍රමණය වූ ආඬිගුරාත්, ඔහුගේ බිරිඳත් අප රට වට්ටෝරු වෙදුන්, ආණ්ඩුවේ නිලමේලාත්, සිනාවට ඉලක්ක කරන සොකරි කතාව පවා සිංහලයන්ගේ අදීනත්වය ප්‍රකට කෙරෙන රචනාවක් ලෙස නොසැලිකය යුතු ද? මුලදී හින්දූන්ගේ දේවතාවියක වූ පත්තිනි ලංකාවේ දී බෝධිසත්ව චරිතයක් බවට පත්කිරීමත්, රාගාධික ස්ත්‍රියක සේ නාට්‍යයේ නිරූපණය වන සොකරි නාට්‍යය අවසන් වන විට ගමට රටටසශ්‍රීකත්වය ළඟා කර දෙන සෙනෙහෙබර අම්මා කෙනෙකු බවට පත්කොට ඇය පත්තිනියගේ ම අවතාරයකැයි ඇඟෙන සේ සිද්ධි ගැළපීම ද, මාර්ටින් වික්‍රමසිංහ කියන පරිදි සිංහලගැමියාගේ අදීනත්වයේ ලක්ෂණයක් සේ නොසැලකිය යුතු ද?

(i) ගැමි නාටකය තුළ සොකරි නිරූපණය වන්නේ කෙලෙස ද?
(ii) සොකරි නාටකය තුළින් අපේක්ෂා කළ යම් අරමුණක් සඳහන් කරන්න.
(iii) රටේ රාජ්‍ය බලයට තර්ජනයක් වූ පිරිස කවුරුන්ද?
(iv) සොකරි තුළින් ලබාදෙන පණිවිඩය කුමක්ද?
(v) නාටකයෙහි එන චරිත 2ක් නම් කරන්න.
(vi) නාටකය අවසානයේ සොකරි නිරූපණය වන්නේ කෙබඳු ආකාරයටද? (ලකුණු 12)

(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා, එහි වචන සංඛ්‍යාව **<u>තුනෙන් එකක් පමණ වන සේ</u>** සාරාංශ කොට ලියා සාරාංශයේ අග වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

වසර දහස් ගණනක ඉතිහාසයේ සිට ශ්‍රී ලංකාවේ අපට උරුමව ඇති මහා සංස්කෘතික හා කලා උරුමයකි, දායාදයකි, සූර්ය මංගල්‍යය හෙවත් අලුත් අවුරුද්ද හා බැඳුණ සිරිත් විරිත් වත් පිළිවෙත් ආදිය. නව අවුරුද්ද හා බැඳුණ දේශීය වෛද්‍ය කර්මයන්හි එන යහ පුරුදු, සෞඛ්‍යාරක්ෂක වත්පිළිවෙත්, චාරිත්‍ර වාරිත්‍ර හා දේශීය ආහාර ඖෂධ ශාක වර්ග භාවිතවන පිළිවෙළ ආදිය යි. 'සුබ නව වසරක්' ලෙස අදහස් කරන්නේ චන්ද්‍ර මාස ක්‍රමයෙන් පළමු මාසය වන බක් මස මැද දී උදාවන සූර්යා ගමනයේ නව සංක්‍රාන්තිය හෙවත් සූර්යයා මීන රාශියෙන් මේෂ රාශියට ප්‍රවිෂ්ට වීමෙන් උදාවන නව වසරයි. හිරු මේෂ රාශී ගතවීමේ දී සිදුවන ජෛවීය හා පාරිසරික වෙනස්වීම, සමඟින් සිදුවන කාලගුණික හා දේශගුණික වෙනස්කම්, මෙන් ම ගහ කොළ සතා සීපාවා සේම මනුෂ්‍යයන් තුළ ද ඇතිවන කායික හා මානසික ස්වරූපයන්හි වෙනස්වීම් කෙරෙහි ආයුර්වේද වෛද්‍යවරයා දැන සිටියේ ය. එ නිසා ම ඔහු නව අවුරුදු නැකැත් කාල නියමයන් ආයුර්වේදීය නියමානුකූල ව ගොඩනැගූ චාරිත්‍ර වාරිත්‍ර විධිවලින් පොහොසත් කළේ ය. හරවත් කළේ ය. එමගින් සෞඛ්‍ය සම්පන්න, නිරෝගී ජනතාවක් ද එසේ ම යහ සිරිත් විරිත් අතින්, යහජීවන පුරුදු මගින් ගුණ ගරුක, විනීත හා ස්ථාවර, සංවර්ධනශීලී ජනතාවක් මෙරට ඇති කිරීමට දායක විය. (ලකුණු 13 යි)

03. දී ඇති මාතෘකාවලින් එකකට අදාළව වචන 300-350 අතර වනසේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූලව ලියන්න.

(i) නූතන තාක්ෂණය අබිමුවේ වැනසී යන සොබා දහම.

(ii) රටක සංවර්ධන ක්‍රියාවලියට බාධා පමුනුවන දේශපාලන ප්‍රතිපත්ති.

(iii) සාහිත්‍යාංගයක් වශයෙන් වර්තමාන සිංහල ගීත ප්‍රබන්ධවල පවත්නා වැදගත්කම හා අනන්‍යතාව.

(iv) තරුණ ශ්‍රමය රටේ සංවර්ධනය සඳහා ඵලදායීව යොදා ගැනීමේ වැදගත්කම.

(v) කාර්යක්ෂම රාජ්‍ය සේවයක් සඳහා ගත යුතු ක්‍රියාමාර්ග. (ලකුණු 25යි)

04. (අ) පහත සඳහන් වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදොස් කොට ලියන්න.

(i) තරුකැල නිල් අහස්තලය අලංකාර කරති.

(ii) ඔහු ද මම ද මිනිසා ද ගමට ගියේය.

(iii) ඇ දෙවඟනයක් මෙන් රූමත් ය.

(iv) මම දරුවන් ගැයූ ගීත අසා සිටියෙමි.

(v) දරුවෝ නාට්‍ය බලනවා නම් දෙමව්පියෝ සතුටුවෙති.

(ආ) පහත සඳහන් වාක්‍ය කර්මකාරයකට හරවන්න.

(i) ජනාධිපතිතුමා ඇමතිවරුන් ඇගයීමට ලක් කරයි.

(ii) සිංහයෝ මුව දෙනක අල්ලා ගත්හ.

(iii) කම්කරුවා ලොරියට වැලි පටයි.

(iv) පියාණෝ අප සැනසූහ.

(v) බැතිමත්හු බුද්ධ පූජාවන් කරති.

(ඇ) නිවැරදි වැකියක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පද වරහන් තුළින් තෝරා ලියන්න.

(i) ගුරුවරු (ශිෂ්‍යයන් / ශිෂ්‍යයෝ) කැටුව චාරිකාවට සහභාගි (වූහ / වූවේය)

(ii) (සමහරෙක් / සමහරෙකු) මවු ගුණ (ගයති / ගයයි)

(iii) (නායකයන් / නායකයෝ) නිසි මඟ දක්වති'යි මිනිස්සු (සිතති / සිතයි)

(iv) (රජවරු / රජවරුන්) වහලුන් ලවා බලෙන් වැව් (සාදවති / සාදවයි)

(v) (ඕ තොමෝ / ඕ තුමූ) තියුණු ස්වරයෙන් කිසිවකු (ඇමතුවාය / ඇමතූහ)

05. පහත දැක්වෙන වාක්‍යවල තද කළු අකුරින් මුද්‍රිත පදවල ව්‍යාකරණ අංගය දක්වා ඇත. ඒවායෙහි අනුඅංගය දක්වන්න.

(i) **සැරද**, **පරෙවිඳු** සඳ පඬුවන් **සුරත්** සරණින්.
(සැරද - ක්‍රියා පද, පරෙවිඳු - සන්ධි පද, සුරත් - අව්‍ය පද)

(ii) රන් රසේ එක්වන **ලෙසේ** වෙණ **නාද නූ**පා **තබ තබා**.
(ලෙසේ - නිපාත පද, නාදනූ - සන්ධි පද, තබ තබා - ක්‍රියා පද)

(iii) **මලගෙටියෙන්** පැන් **පොවමින් අතිනතින**.
(මලගෙටියෙන් - විභක්ති පද, පොවමින් - ක්‍රියා, අතිනතින- සන්ධි)

(iv) **වැදගත් මිතුර තුන්සිත** කර සමාධී.
(වැදගත් - ක්‍රියා පද, මිතුර - විභක්ති, තුන්සිත - සමාස පද)

(v) **නූතන** තරුණ කැළ **දේශානුරාගයෙන්** නගර **අලංකාරවත්** කරති.
(නූතන - තද්ධිත පද, දේශානුරාගයෙන් - සන්ධි, අලංකාරවත් -තද්ධිත පද) (ලකුණු 5 x 3 = 15)

06. පහත දැක්වෙන වාක්‍යවල හිස්තැනට වඩාත්ම ගැළපෙනපදය වරහන තුළ දී ඇති පද අතුරෙන් තෝරා ලියන්න.

(ආශ්චර්යය, තරඟ, පතළ, ඓශ්වර්යය, පතල, තරග)

(අ) 1. ලොව ..................... ගත් කතුවරයෙකු වශයෙන් ගී ද මෝපසාං කෙටිකතාකරණය බැබළවීය.
2. මහනුවර දළදා මාලිගාව ලෝක ප්‍රසිද්ධ ................................ වස්තුවක් බවට පත් වී තිබේ.
3. ඔවුන් විසින් හාරන ලද මිනිරන් ..................... ඉතා විශාල එකකි.
4. සිංහල භාෂා දින ......................... දීප ව්‍යාප්ත ව දියත් වන්නකි.
5. ධන කුවේරයාගේ ................................ මුළු නගරයම මහත් ආඩම්බරයකි.
6. පරාක්‍රම සමුද්‍රයෙහි නැගෙන ජල ............................... ගත සිත පුබුදුවාලයි.

(ලකුණු 1/2 x 6 = 3)

(ආ) පහත දක්වා ඇති පද සන්ධි කරන්න.

| | | | |
|---|---|---|---|
| (i) | ස + අතිශය | (ii) | වි + අවුල් |
| (iii) | මහනු + කම් | (iv) | මහ + උර |
| (v) | බුදු + සරණ | (vi) | මුදල් + ඉඳු |

(ලකුණු 1/2 x 6 = 3)

(ඉ) තද කළු අකුරින් මුද්‍රිත පදවල විභක්ති නම් කරන්න.

(i) **දෙගුරුන් විසින්** තම **දරුවන්ට** දෙන නොමදදන නම්.
(ii) **ජනාධිපතිතුමනි, රාජ්‍යසේවකයන්ගේ** වැටුප් විෂමතා ඉයත් කරනු මැනවි.
(iii) **මලින්** මලට ඉගිලුනාට **වනබඹරුන්** නොවේ. (ලකුණු 1/2 x 6=3)

(ඊ) අවශ්‍ය තැන්වල විරාම ලක්ෂණ යොදා පහත දැක්වෙන වාක්‍ය නැවත ලියන්න.

(i) කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත යනුවෙන් දෙවන පරාක්‍රමබාහු රජතුමා හැඳින්වූ ගෞරව නාමය වේ
(ii) '' අහෝ මෙවන්විපතක් සිදුවූයේ ඇයි '' යනුවෙන් අම්මා කීවාය
(iii) ''70 80 දශකය මෙරට සුභාවිත ගීත සාහිත්‍ය මැනවින් පෝෂණය වු කාලයක් බව'' විචාරකයෙක් පැවසීය (ලකුණු 1/2 x 6 = 3)

(උ) පහත දැක්වෙන ප්‍රකාශනවල එක් එක් ප්‍රකෘති කථනය විකෘති කථනයට හරවා ලියන්න.

(i) 'මට දෙවියන්ගේ පිහිට ලැබේවා'යි දර්ශනී කීවාය.
(ii) මීට දෙසතියකට පෙර 'නුඹලා මෙතනට ආවාහු'යි නිමල් කීවේය.
(iii) 'අපි හෙට පාසලට යමු'යි' ඔවුහු කීහ. (ලකුණු 1 x 3 = 3)

(ලකුණු 15)

07. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

''මානව සමාජයේ දෙවියන් අරබයා පවත්නා විශ්වාසයේ <u>**මූලාරම්භය**</u> ගැටලු සහිත ය. මේ ගැටලුව <u>**ඓතිහාසික**</u> ගවේෂණ ක්ෂේත්‍රයක් තුළ විසඳ ගත නොහැක්කකි. මූලාරම්භයේ දී හෝ නිර්මාණයේ දී හෝ දෙවියන් පිළිබඳ අදහස යම් මිනිසකුට නිරීක්ෂණය කළ නොහැක්කකි.'' යනුවෙන් සුප්‍රකට මානව විද්‍යාඥයකු වූ ඇන්ඩෘ ලැං පවසයි.

ලෝක නිර්මාණය, සත්ත්වයාගේ මූලාරම්භය, දේව-ප්‍රේත-අසුර වැනිභූත <u>**විශේෂ**</u> අපාය භූමි වැනි දෑ තව ම මානවයා හමුවේ මුළුමනින් ම විසඳී නැති විශ්ව අබිරහස් බවට පත් ව තිබේ. මේවා භෞතික පදාර්ථ සේ <u>**විද්‍යාත්මක**</u> පර්යේෂණ මඟින් හෙළි කරගත හැකි තොරතුරු ද නො වේ. කෙසේ වුව ද <u>**තාක්ෂණය**</u> බෙහෙවින් දියුණු වී ඇති නූතන විද්‍යාත්මක යුගයේ පවා මිනිසා දෙවියන් පිළිබඳ විශ්වාසය ඉවත් කර

නැත. කිතුනු, ඉස්ලාම් වැනි ධර්මයන් පමණක් නොව, භාරතය වැනි බොහෝ රටවල ඇතැම් ආගම් ද රඳ පවතින්නේ දේව **විශ්වාසය** මත ය. අනාත්මවාදී බුදුසමය දේව විශ්වාසය මත ගොඩ නැගුණක් නුවූව ද, බොහෝ **බෞද්ධයෝ** දෙවියන් කෙරෙහි ද කිසියම් ප්‍රමාණයක විශ්වාසයක් තබා කටයුතු කරති. විශේෂයෙන් ම ලක්දිව දේව පුරාණයට ඇත්තේ දිගු ඉතිහාසයකි.

(i) ඡේදයේ තද කළු අකුරින් මුද්‍රිත වචන අකාරාදී පිළිවෙළට සකස් කරන්න.

(ii) තොරතුරු, සත්ත්වයා, බෞද්ධ යන වචනවල පිළි වෙන වෙනම ලියන්න.

(iii) ඉහත ඡේදයෙන් උපුටා දක්වන්න.

1. කණ්ඨතාලුජ අක්ෂරයක් සහ දන්තජ අක්ෂරයක් යෙදී ඇති වචනයක්.
2. අර්ධ ස්වර අක්ෂර දෙකක් එක ළඟ යෙදී ඇති වචනයක්.
3. මූර්ධජ අක්ෂර දෙකක් යෙදී ඇති වචනයක්.

(iv) පහත සඳහන් පද විසන්ධි කර සන්ධි විධිය දක්වන්න.

1. මූලාරම්භය 2. නිරීක්ෂණය 3. මිනිසා

(v) පහත දැක්වෙන ක්‍රියා වර්ගවලට උදාහරණ වචනය බැගින් ඡේදයෙන් උපුටා දක්වන්න.

1. වර්තමාන කාල බහු වචන ක්‍රියා
2. පූර්ව ක්‍රියා
3. අවසාන ක්‍රියා (ලකුණු 3 x 5 = 15)

08. පහත සඳහන් මාතෘකාවලින් තුනක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

(i) පර රූ සඳ

(ii) ඝෝෂ අක්ෂර

(iii) අවධි විභක්ති සමාස

(iv) අසම්භාව්‍ය ක්‍රියා

(v) භාවකාරක කෘදන්ත (ලකුණු 15)